# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2017 මැයි මස 26 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2017.05.29 දින නිකුත් කරන ලදී)**

## විශේෂ තැන්පත් ගිණුම

**ශ්‍රී ලංකාවට විදේශ විනිමය ප්‍රේෂණය කිරීම පිණිස විදේශීය ජාතිකයන් වෙනුවෙන් විශේෂ තැන්පතු ගිණුමක් හඳුන්වාදීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. | තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# විශේෂ තැන්පත් ගිණුම

එල්. ඩී.—ඕ. 54/2016.

**ශ්‍රී ලංකාවට විදේශ විනිමය ප්‍රේෂණය කිරීම පිණිස විදේශීය ජාතිකයන් වෙනුවෙන් විශේෂ තැන්පතු ගිණුමක් හඳුන්වාදීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක දරන විශේෂ තැන්පත් ගිණුම පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

විශේෂ තැන්පත් ගිණුම.

**2.** (1) යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, විදේශීය ජාතිකයකු විසින් (මෙහි මින් මතු ‘‘ගිණුම’’ යනුවෙන් සඳහන් කරනු ලබන) ‘‘විශේෂ තැන්පත් ගිණුම’’ නම් වූ ගිණුමක් මේ පනතේ විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවක විවෘත කර පවත්වාගෙන යා හැකි ය.

(2) (මෙහි මින් මතු "අවම මුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ඇමරිකානු ඩොලර් පන්ලක්ෂයකට නොඅඩු අවම මුදලකින් හෝ ඊට සමාන, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වනු ලබන පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ගිණුම විවෘත කරනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ උපලේඛනයේ දක්වා නොමැති විදේශීය ජාතිකයකු විසින් ගිණුම ක්‍රියාත්මක කළ හැකි වෙනත් යම් පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදල් වර්ග අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.

ගිණුම් හිමියාට දෙනු ලබන පහසුකම්.

**3.** (1) 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව—

(අ) (i) අවම මුදලක් තැන්පත් කර ගිණුම පවත්වා ගෙන යන; හෝ

(ii) අවම මුදලට සමාන මුදලකින් ශ්‍රී ලංකාව තුළ ගිණුම හරහා, නියම කර ඇති යම් ආයෝජනයක යෙදී සිටින බවට ප්‍රමාණවත් සාක්ෂි පෙන්නුම් කරන,

2—PL 005198—475 (2017/05)

ගිණුම් හිමියෙක් ගිණුම විවෘත කිරීමේ දින සිට අවුරුදු දහයක උපරිම කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවේ නේවාසික වීසා ලබා ගැනීමට සුදුස්සකු වන්නේ ය;

(ආ) (i) ඉහත කී අවම මුදලට අමතරව ඇමරිකානු ඩොලර් තුන්ලක්ෂයක් හෝ ඊට සමාන මුදලක් ඉහත කී ගිණුමට තැන්පත් කරනු ලබන්නේ නම්, ගිණුම් හිමියාගේ කලත්‍රයාට ද ශ්‍රී ලංකාවේ නේවාසික වීසා ලබාගැනීමට හිමිකම් ලබන්නේ ය;

(ii) මේ පනත යටතේ ගිණුම් හිමියාගේ නේවාසික වීසා බලපත්‍රය වලංගුව පවතින කාලය තුළ පමණක් ශ්‍රී ලංකාවේ නේවාසික වීසා ලබාගැනීමට ගිණුම් හිමියාගේ කලත්‍රයාට ද හිමිකම් ලැබෙන්නේ ය;

(ඇ) මේ පනත යටතේ ලබාගත් ගිණුම් හිමියාගේ නේවාසික වීසා බලපත්‍රය වලංගුව පවතින කාලය තුළ දී හෝ එම ගිණුම් හිමියාගේ බාල වයස්කාර ළමයින්ට වයස අවුරුදු දහඅට සම්පූර්ණ වීම යන කාල සීමා දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා, ශ්‍රී ලංකාවේ නේවාසික වීසා බලපත්‍ර ලබා ගැනීමට ගිණුම් හිමියාගේ බාල වයස්කාර ළමයින්ට හිමිකම් ඇත්තේ ය.

(2) යම් ගිණුම් හිමියකු විසින් නේවාසික වීසා බලපත්‍රය වලංගුව පවතින කාලය තුළ ගිණුම පවත්වාගෙන යා යුතු ය.

(3) මේ පනතේ කාර්ය සඳහා ගිණුම හරහා ගිණුම් හිමියකු විසින් ආයෝජනය කළ හැකි ආයෝජන වර්ග පිළිබඳව අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.

(4) ලිඛිත නීතියට අනුකූලව තත්කාර්ය සඳහා ප්‍රදානය කරන ලද රැකියා වීසා බලපත්‍රයක් නොමැතිව, ගිණුම් හිමියකුට යම් ගෙවීම් සහිත රැකියාවක නිරතවීමට හිමිකම් නොතිබිය යුතු ය.

(5) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන යම් පරිපාලන හෝ මෙහෙයුම් බද්දකට යටත්ව 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ—

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත උපචිත වූ ආදායමක් හෝ ලාභයක් මත; සහ

(ආ) ගිණුමේ පවත්නා ප්‍රාග්ධනය මත හෝ ආදායමෙන් උපචිත පොළිය මත,

යම් බදු හෝ වෙනත් අයකිරීම්වලින් සෑම ගිණුම් හිමියකු ම නිදහස් විය යුතු ය.

(6) ශ්‍රී ලංකාවට සිදුකරනු ලබන ප්‍රේෂණ සීමා පිළිබඳ 1973 අංක 39 දරන විනිමය පාලන පනතේ විධිවිධාන මේ පනත යටතේ ගිණුම් හිමියකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(7) අධිකරණයක් විසින්, යම් ලිඛිත නීතියක් මගින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති විට හැර, සියලු අවස්ථාවල දී ගිණුම සම්බන්ධයෙන් රහසිගතභාවය පවත්වාගෙන යා යුතු ය.

වීසා නිකුත් කිරීම අවලංගු කිරීම යනාදිය සම්බන්ධව.

**4.** (1) මේ පනතේ කාර්ය සඳහා ප්‍රදානය කරන ලද යම් වීසා බලපත්‍රයක් නිකුත් කිරීම, අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 1948 අංක 20 දරන ආගමන හා විගමන පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තියට අමතරව, පහත සඳහන් අවස්ථාවල දී, වීසා බලපත්‍රය අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුතු ය:—

(අ) ගිණුම් හිමියකුගේ මරණය සිදු වූ විට;

(ආ) ගිණුම් හිමියකු රාජද්‍රෝහී වීම සම්බන්ධයෙන් සැක කරනු ලැබූ විට;

(ඇ) (3) වන උපවගන්තියට යටත් ව, මේ පනතේ නිශ්චිතව දැක්වෙන අවම මුදල පවත්වා ගෙන යාමට ගිණුම් හිමියකු අපොහොසත් වන විට;

(ඈ) ගිණුම් හිමියා බංකොලොත් බවට විනිශ්චය කර ඇති විට;

(ඉ) ගිණුම් හිමියා විසින් ආයෝජනය කිරීම සඳහා උපයෝජනය කරනු ලබන විදේශ විනිමය, ගිණුම හරහා යෙදවීමට අපොහොසත් වන විට;

(ඊ) ගිණුම වසා දමනු ලබන විට.

(3) 3(1)(අ) වගන්තියේ නිශ්චිතව දැක්වෙන අවම මුදල පවත්වාගෙන යාමට ගිණුම් හිමියා අපොහොසත් වන අවස්ථාවක, එක් ලිත් මාසයකට වඩා වැඩි නොවන අනුග්‍රහ කාල සීමාවක් ගිණුම් හිමියාට ලබා දීමෙන් පසු දින හතක් ඇතුළත, අදාළ වාණිජ බැංකුව විසින් ඒ පිළිබඳව ආගමන හා විගමන පාලකවරයා වෙත දැනුම් දිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් සිදුවීමක් මත වීසා බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක, 1948 අංක 20 දරන ආගමන හා විගමන පනත යටතේ නිකුත් කරනු ලැබිය හැකි යම් විධානයකට, නියමයකට හෝ උපදෙසකට අනුකූලව අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමට හෝ විදේශ කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ යම් විධානයකට අනුකූලව ක්‍රියා කිරීම, ගිණුම් හිමියාගේ කාර්යය විය යුතු ය.

**5.** (1) මේ පනත යටතේ නියම කර ඇති සියලු කාරණා සම්බන්ධයෙන් සහ නියෝග සෑදීමට බලය පවරා ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, ඒවා එසේ පළකරනු ලබන දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව දැක්වෙන පසු දිනයක සිට බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු අතර, එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් සිදු නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

*අර්ථ නිරූපණය.*

**6.** මෙම පනතෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

"ගිණුම් හිමියා" යන්නෙන් මේ පනත යටතේ ගිණුමක් විවෘත කර එය පවත්වාගෙන යන විදේශීය ජාතිකයකු අදහස් වේ;

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන් 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"වාණිජ බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලපත්‍රලාභී වානිජ බැංකුවක් අදහස් වේ;

"විදේශීය ජාතිකයා" යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන ස්වභාවික පුද්ගලයකු අදහස් වන අතර, ඊට ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසියකු ද ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**උපලේඛනය** [2(2) වගන්තිය]

1. බ්‍රිතාන්‍ය පවුම්
2. යුරෝ
3. ඕස්ට්‍රේලියානු ඩොලර්
4. ජපන් යෙන්
5. සිංගප්පූරු ඩොලර්
6. කැනේඩියානු ඩොලර්
7. ස්විස් ෆ්‍රෑන්ක්

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.